www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂය යාපනයේ සාර්ථක මහජන රැලියක් පවත්වයි

## Sri Lankan SEP holds successful public meeting in Jaffna

අපගේ වාර්තාකරුන් විසිනි
2009 ජුලි 21

සමාජවාදී සමානතා පක්ෂය විසින් හමුදා පාලිත යාපනයේ දී පසුගිය සෙනසුරාදා "ලෝක ආර්ථික අර්බුදය සහ අධිරාජ්‍යවාදී ආක්‍රමනය" යන මැයෙන් සාර්ථක මහජන රැස්වීමක් පැවැත්වූයේය. නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවති රැස්වීම සඳහා කම්කරුවන්, ගොවියන්, ධීවරයන්, ගුරුවරුන් සහ ගෘහනියන් ඇතුලු 60 කට ආසන්න පිරිසක් සහභාගි වූහ.

රැස්වීම පැවැත්වුනේ අගෝස්තු 8 වන දාට නියමිත යාපනය නගර සභා මැතිවරනය මධයයේ ය. ආන්ඩුව යාපනය සහ වවුනියාවේ පලාත් පාලන මැතිවරනය කැඳවූයේ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය හමුදාමය වශයෙන් පරාජය කිරීමෙන් පසු උතුර සහ නැගෙනහිර පලාත්වල එහි මිල්ටරි වාඩි ලා ගැනීමට වංචනිකප්‍රජාතන්ත්‍රවාදී මුහුනුවරක් ලබා දීමට ය.

යාපනය නගරයේ පවතින ආරක්ෂක අවහිරතා නිසා සසප සාමාජිකයන්ට රැස්වීම සඳහා ප්‍රචාරන කටයුතු කිරීමට සිදු වූයේ ඉතා සීමිත ආකාරයකිනි. කෙසේවතුදු අත් පත්‍රිකා 2,000ක් සහ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි ලේඛනවල ඡායා පිටපත් වැඩපලවල් , යාපනය ප්‍රධාන බස් නැවතුම්පොල සහ ධීවරයන් අතර බෙදු හැරීමට ඔවුහු සමත් වූහ. පෝස්ටර් 300ක් පමන යාපනය සහ අරියාලෙයි, තිරුනෙල්වේලි, අනෙයිකොඩ්ඩෙයි, මනිපායි, චන්කනෙයි, සහ චුන්නාගම් යන ප්‍රදේශයන් ආවරනය වන පරිදි පෝස්ටර් 300ක් පමන ඇලවූහ.

තුන් ලක්ෂයකට ආසන්න දෙමල සිවිල් වැසියන් රැඳවුම් කඳවුරුවල සිරගත කොට තබා ඇති වවුනියාවේ සිට ලෝසවෙඅයේ නිත්‍ය පාඨකයෙක් දුරකථනයෙන් රැස්වීමට සුබ පැතුවේය. වවුනියාවේ සිට යාපනයට ඇති ඒ 9 මාර්ගයේ මහජන ගමනාගමනයට හමුදාව විසින් විවෘත කර නොමැති බැවින් ඔහුට රැස්වීමට පැමිනීමට නොහැකිවිය.

සසප මධ්‍යම කාරක සභික ටී. අභිලන් රැස්වීමේ මුලසුන හෙබවීය. යුද්ධය හේතුවෙන් දීර්ඝ කාලයකින් යාපනය නගරයේ සසප විසින් රැස්වීමක් ප්‍රථම වරට පවත්වන බව ඔහු පැහැදිලි කලේ ය. සමාජවාදී සමානතා පක්ෂය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) ලංකා ශාඛාවයි. එහි පූර්වගාමියා වන විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස), ලංකා සමසමාජ පක්ෂය (ලසසප) 1964 සිරිමා බන්ඩාරනායකගේ ධනපති ආන්ඩුවට ඇතුලත් වෙමින් ට්‍රොට්ස්කිවාදී මූලධර්මයන් පාවාදීමට එරෙහිව කරන ලද අරගලයේ දී 1968 දී පිහිටුවනු ලැබුනි.

ශ්‍රී ලංකාව තුල තියුනු ලෙස ප්‍රකාශයට පැමින තිබෙන ලෝක ආර්ථිකයේ ගැඹුරු අර්බුදයක කොන්දේසි යටතේ රැස්වීම පැවත්වෙන බව අභිලන් පැහැදිලි කලේ ය. යුද්ධයේ නිමාව වැඩ කරන ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් සහ ජීවන කොන්දේසීන් මත දැවැන්ත ප්‍රහාරයන් කරනවා මිස සාමය සහ සෞභාග්‍ය උදා කරන්නේ නැත. "ධනවාදයේ මෙම ගැඹුරු වෙමින් පවතින අර්බුදය මධ්‍යයේ කම්කරු පන්තිය සඳහා සමාජවාදී වැඩ පිලිවෙලක් ඉදිරිපත් කරන එකම පක්ෂය සමාජවාදී සමානතා පක්ෂය පමනි" ඔහු කීවේය.

ප්‍රධාන කථික, සසප මධ්‍යම කාරක සභික මයිල්වාගනම් දේවරාජා තම කතාව අරඹමින්, "දශක තුනකට ආසන්න සිවිල් යුද්ධය කෙලවරකට පැමින ඇති නමුදු දෙමල ජනයාට වෙනස්කම් කිරීම මෙන් ම මර්දනය කිරීම අඛන්ඩව කෙරීගෙන යයි. ලක්ෂ තුනකට ආසන්න සිවිල් ජනයා මූලික පහසුකම්වලින් තොර රැඳවුම් කඳවුරු තුලට ගාල් කර ඇත. උතුරේ සහ නැගෙනහිර මිලිටරි වාඩි ලා ගැනීම තවතවත් වැඩි කරමින් ඇත. ජනාධිපත මහින්ද රාජපක්ෂ කම්කරු පන්තිය මත ආර්ථික යුද්ධයක් ප්‍රකාශ කර තිබේ. දිග හැරෙමින් පවතින ලෝක අර්බුදය වටහාගැනීමෙන් තොරව ශ්‍රී ලංකාවේ හෝ අන් කිසිදු රටක සිදුවන දේවල් අපට වටහා ගැනීමට හැකියාවක් නැත"යි ඔහු සඳහන් කලේ ය.

දෙවන ලෝක යුද්ධයකට සහ මහා ආර්ථික අවපාතයට හේතු පාදක වූ අවසන් ප්‍රධාන ධනේශ්වර බිඳ වැටීම කතකයා විසින් සඳහන් කලේ ය. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව, නියාමයන් මාලාවක් හරහා ලෝක ආර්ථිකය ස්ථාවර කිරීමේ වගකීම ඇමරිකා එක්සත් ජනපදය භාර ගත්තේ ය. එයට එසේ කල හැකි වූයේ, යුද්ධයෙහි විනාශභාග් වූ අනෙකුත් අධිරාජ්‍යවාදී රටවලට සාපේක්ෂව තමන් භුක්තිවිඳි දැවැන්ත ආර්ථික බල මහිමයේ ප්‍රතිඵල ආධාරයෙනි."

එක්සත් ජනපද ආර්ථික අධිකාරය මැකී යත්ම, 1970 ගනන් වල දී පශ්චාත් යුද ආර්ථික සමථයන් කඩා වැටීමට පටන් ගත් අයුරු ඔහු විස්තර කලේ ය. ඇමරිකාව ඔවුන්ගේ කඩා වැටීමට මුක්කු ගසා ගැනීමේ උපායක් වශයෙන් ලෝකය තුල තමන්ගේ ගෝලීය අධිකාරිය පවත්වා ගැනීමට ඉතිරිව ඇති මිලිටරි බලය යෙදීමට කාරනා සොයමින් සිටී. තෙල් සම්පත්වලින් පොහොසත් ඉරාකයේ යුද්ධය සහ ඇෆ්ඝනිස්ථානය තුල ඇමරිකන් ආක්‍රමනය මෙම ව්‍යායාමයේ කොටසකි."

ඇෆ්ඝනිස්ථානය සහ පකිස්ථානය කෙරෙහි ඔබාමා පාලන තන්ත්‍රයේ කේන්ද්‍රීය අවධානය වඩා දුර යන්නා වූ, විශේෂයෙන් සම්පත් බහුල මධ්‍යම ආසියාවේ, ඇමරිකානු ආර්ථික සහ භූලෝපායික අරමුනු එල්ල කොට ඇතැයි ඔහු ප්‍රකාශ කලේ ය. ශ්‍රී ලංකාව ද ඇතුලත් දකුනු ආසියාව, ප්‍රමුඛ බලවතුන් අතර තරගයේ ප්‍රධාන රංග පථයක් වී තිබේ.

"එකකට එකක් පසුව පැමිනි කොලඹ ආන්ඩු විසින් පවත්වාගෙන ගිය වර්ගවාදී යුද්ධය නිසාවෙන් පසුගිය අවුරුදු තිහ පුරාම දෙමල ජනයා දැවැන්ත පරිමානයකින් පීඩාවට පත් කර ඇත. දෙමල විරෝධී යුද්ධය, වාර්ගික රේඛා ඔස්සේ, කම්කරු පන්තිය භේද භින්න කිරීමට යහමින් යොදා ගනු ලැබින. රාජපක්ෂ ආන්ඩුව විසින් රට නැවත අර්බුදයට ඇද දමන විට, එක්සත් ජනපදය, චීනය හා ඉන්දියාව ඇතුලත් ප්‍රමුඛ බලවතුන් විසින් තමන්ගේ අවශ්‍යතාවන් ඉදිරියට දමා ගැනීමට කොලඹ ආන්ඩුවට සහාය පලකර සිටියේ ය," ඔහු ප්‍රකාශ කලේ ය.

"එල්ටීටීඊයේ මිලිටරි පරාජය බෙදුම්වාදී දෙමල ධනේශ්වර රාජ්‍යයක් පිලිබඳ එහි බංකොලොත් ඉදිරි දර්ශනය සමග බැඳී පවතී. තමන්ගේ අරමුනු සපුරා ගනු වස් ඔවුන් හැම විටම ඒ හෝ මේ ප්‍රමාන බලවතාගේ සහය සෑම විටම ප්‍රාර්ථනා කලේ ය. කොලඹ ආන්ඩුවේ වාර්ගික වෙනස්කම් කිරීමට එරෙහිව සිංහල, දෙමල, මුස්ලිම් කම්කරුවන් සහ ඉන්දියාවේ සහ ජාත්‍යන්තර කම්කරුවන්ගේ ඒකාබද්ධතාව සඳහා ඔවුන් කිසි දිනෙක කැඳවුම් කලේ නැත. කම්කරු පන්තිය කෙරෙහි පවතින මෙම සතුරු භාවය ගලා එන්නේ, එල්ටීටීඊය දෙමල ධනපති පන්තියේ කොටසක අවශ්‍යතාවන් නියෝජනය කලේය යන කාරනාවෙනි."

ඈාපනය සහ වවුනියාව මැතිවරන සඳහා තරග වදික කිසිදු පක්ෂයක් වැඩ කරන ජනයාගේ අවශ්‍යතා නියෝජනය කරන්නේ නැති බව දේවරාජා ප්‍රකාශ කලේ ය. "දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) මැතිවරන ප්‍රකාශනයේ, උතුරු නැගෙනහිර දෙමල මාතෘභූමිය තුල දෙමල සහ මුස්ලිම් ජනයින්ගේ අධිකාරිය ස්ථාපිත කරන ඇති දේශපාලන විසඳුමක් සඳහා සැලැස්මක් ඉදිරිපත් කරනු ඇතැයි" යන් ඔහු උපුටා දැක්වීය.

"මෙම 'දේශපාලන විසඳුම' යන්නෙන් දෙමල ධනපති පන්තියේ වරප්‍රසාද ආරක්ෂා කර ගැනීමට කොලඹ ආන්ඩුව සමග එකඟතාවකට ඒමට ඉලක්ක කර ගත්තක් මිස, සාමාන්‍ය දෙමල ජනයාගේ අවශ්‍යතා පිලිබඳ මොනයම්ම හෝ කැක්කුමක් ඇතිව ඉදිරිපත් කල එකක් නොවේ." ඔහු සඳහන් කලේ ය. පූර්වයෙන් එල්ටීටීඊයේ හොරනෑවක් වූ ටීඑන්ඒ, රාජපක්ෂ ආන්ඩුව සමග කටයුතු කිරීමේ අවස්ථාවක් සොයමින් සිටී. 'දේශපාලන විසඳුමක්' ලඟා කර ගැනීමට ඉන්දියාව ද ඇතුලත් ජාත්‍යන්තරයේ සංගත සඳහා ටීඑන්ඒ නායකයින්ගේ ආයාචනාවන් දේශකයා විසින් උපටා දැකවූයේ ය. මෙ පක්ෂය මුලුමනින් ම සිය දෙපා රඳවා ඇත්තේ ලෝක සහ කලාපීය බලයන් මත යයි ඔහු සඳහන් කලේ ය.

එමෙන්ම සිය පක්ෂය ආන්ඩුව සමග ගැටුමකට යනවා වෙනුවට මිත්‍ර සහයෝගයෙන් කටයුතු කිරීම හරහා දෙමල ජනයාගේ ඉල්ලීම් දිනා ගන්නේ යැයි වාචාල දොඩවන ආන්ඩුවේ ඇමතියෙන් සහ ඊලම් ජනතා ප්‍රජාතන්තවාදී පක්ෂයෙ නායක ඩග්ලස් දේවානන්දගෙන් ද දේවරාජා උපුටා දැක්වූයේ ය.

"මේ දේශපාලන වාසියක් සොයමින් සිටින ධනපති පන්තියේ තවත් පක්ෂයකි." ඔහු කීවේය. "එය දෙමල ජනයාට එරෙහි රාජපක්ෂගේ යුද්ධයට සහාය පල කල අතර, හමුදාව සමග එකට වැඩ කරන අතුරු හමුදා කන්ඩායමක් මෙහෙයවූයේ ය. දෙමල ප්‍රභූවේ අනිකුත් පක්ෂ දෙමල එක්සත් විමුක්ති පෙරමුන ඇතුලත් කර ගනියි. පසුගිය දින කීපය පුරාම මිනිසුන්ගෙන් අපට අසන්නට ලැබුනේ මෙම සියලු පක්ෂ කෙරෙහි ඔවුන්ගේ වෛරයයි. දෙමල ධනපති පන්තියේ සෑම කන්ඩායමක් ම පෙන්නුම් කරනු ලැබ ඇත්තේ ඔවුන් වනාහී මහජනතාවගේ වියදමින් කොලඹ ආන්ඩුව සමග ගනුදෙනුවකින් කොටසක් ලබා ගැනීමට කෙල හලමින් සිටින චූදිත බෙලහීන කන්ඩායමක් බවයි."

ශ්‍රී ලංකාවේ දෙමල ජනයාගේ සමස්ත අත්දැකීම් විසින් සසප දේශපාලන ඉදිරි දර්ශනය මොනවට ඔප්පු කර ඇති බැව් දේවරාජා පකාශ කලේ ය. යුද්ධාරම්භයේ පටන් ම දිවයිනේ උතුරින් සහ නැගෙනහිරින් හමුදාව කොන්දේසි විරහිතව ආපසු කැඳවීමට අනවරතව ඉල්ලා සිටින එකම පක්ෂය වන්නේ සමාජවාදී සමානතා පක්ෂය සහ එහි පූර්වගාමී පක්ෂය වූ විප්ලවවාදී

කොමියුනිස්ට් සංගමය ම පමනි. දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා ධනේශ්වර පාලනයට එරෙහි ව., සිංහල දෙමල සහ මුස්ලිම් කම්කරු පන්තිය විසින් ගෙනයන ඒකාබද්ධ දේශපාලන අරගලයක් හරහා ම පමනක් දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍රික අයිතීන් සාක්ෂාත් කර ගත හැකි වන්නේ. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ඔස්සේ ජාත්‍යන්තර සමාජවාදය සඳහා ජාත්‍යන්තර අරගලයේ සහ එස්ඊපී ඉදිරි දර්ශනය අධ්‍යයනය කිරීමටත් එස්ඊපී ගොඩ නැගීමට ඒකාබද්ධ වන ලෙසත් ඔහු ශ්‍රාවකත්වයෙන් ඉල්ලා සිටියේ ය.

බොහෝ මිනිසුන්ගෙන් දේශනයට උද්යෝගීමත් ප්‍රතිචාරයක් ලැබුනු අතර කතාවෙන් පසුව එස්ඊපී සාමාජිකයන් සමග ප්‍රශ්න පිලිබඳ සාකච්ඡා කිරීමට නතරව හුන්නෝ ය. පක්ෂයේ අරමුදල වෙනුවෙන් රුපියල් 3,000කට වැඩි ආධාර මුදලක් ලැබිනි.

තාක්ෂනික නිලධාරියෙකු වන කනකරත්නම්., ''සමාජවාදය පිලිබඳ මේ ආකාරයේ රැස්වීම් කීප පොලක සංවිධානය කිරීමට අපට පුලුවන්. මේ මැතිවරනය කිසිම දෙයක මිනිස්සුන්ට දෙන්නේ නෑ. දිනපතාම මිනිස්සු අනාථ කඳවුරුවල මැරි මැරී යනවා. එම කඳවුරුවලින් නිදහස් වීමටයි ඔවුන්ට අවශ්‍ය''.

යාපනය විශ්වවිද්‍යාලයේ සේවකයෙකු සඳහන් කලේ, '' මේ වගේ තව රැස්වීම්වලට අපි සහාය දෙනවා. මේ වෙබ් අඩවිය ඉතා විශිෂ්ට මාධ්‍යයක්. ඒත් යාපනයේ සියයට අනූවක ජනතාවකට අන්තර්ජාල ප්‍රවේශයට පහසුකම් නෑ. ඔබලාගේ වැඩ පිලිවෙල අත් පත්‍රිකා සහ අනෙකුත් මුද්‍රිත ආකාරයන්ගෙන් ප්‍රචාරය කිරීමට මෙන්ම එය මහ ජනයා සමග සාකච්ඡා කිරීම අත්‍යවශ්‍ය ය'' යි යනුවෙනි.

'' මෙම පලාස් ආන්ඩු මැතිවරනය අනවශ්‍ය එකක්. මිනිස්සු තුන් ලක්ෂයක් රැඳවුම් කඳවුරුවල ගාල් කරලා. මේ තත්ත්වය මැද මෙම මැතිවරනයෙන් ඔවුන්ට සහායක් ලැබේවිද?''යාපනය විශ්වවිද්‍යාල සිසුවෙක් කෝපයෙන් ලෝක ලෝසවෙඅ යෙන් ඇසීය.

ධීවරයෙකු., අපිට මෙම මැතිවරනය පිලිගන්න බෑ. මිනිස්සු විශාල ප්‍රමානයක් රැඳවුම් කඳවුරුවල, අපට නිදහසේ එහෙ මෙහෙ යන්න ඉඩක් දෙන්නේ නැහැ. ආන්ඩුව පාරම්බෑ පැය විසිහතරේ මාලු බෑම නිකම්ම වචන විතරයි. ප්‍රායෝගිකව ඇත්තක් වෙලා නෑ''යි කීවේය.

හිටපු ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකයෙකු වූ ඒ.ජී. මුත්තයියා., ''මම ජාත්‍යන්තර සමාජවාදය විශ්වාස කරනවා. 1964 දී ලසසපය සිරිමා බන්ඩාරනායකගේ සන්ධාන ආන්ඩුවට එක් වීමට තීරනය කල විට, විපක්ෂයේ රැස්වීමක් යාපනයේ පැවතුනා. මමත් එහි ඉඳියා. එම පාවාදීම නිසාවෙන් අද අපි දුක් විඳිනවා. දේශපාලනය පිලිබඳ මගේ කැමැත්ත නැතිව ගොස් තිබුනත් ., මෙම රැස්වීමෙන් පස්සේ දිගටම ඔබලා සමග සම්බන්ධතාව පවත්වා ගැනීමට මට අවශ්‍යයි'' කියා සිටියේ ය.